**දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල - 2017**

**---------------------------------------------------------------------------**

දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1992 අංක 09 දරන දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල් පනතේ 9(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අරමුදලේ සභාපතිවරයා වෙත 2018 ජූනි 06 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI-1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ මෙහෙයුම් කටයුතුවලින් රු. 165,974 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.513,677 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.679,651 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේ දී අක්ෂිකාච ලබාදීම සඳහා දරන ලද වියදම රු.1,012,500 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

(අ) සමාලෝචිත වර්ෂයේ සිසුන් 400 ක් සඳහා අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු වෙනුවෙන් රු.4,500,000 ක් ප්‍රතිපාදනය කර තිබුණ ද ලුවීබ්‍රේල් ශිෂ්‍යාධාර, උසස් පෙළ සිසුන් සඳහා ශිෂ්‍යාධාර සහ විශ්වවිද්‍යාල සිසුන් සඳහා ශිෂ්‍යාධාර වශයෙන් සිසුන් 261 දෙනෙකුට සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ආධාර ලෙස ලබා දී තිබුණේ රු. 2,090,000 කි.

සිසුන්ට ශිෂ්‍යාධාර ලබාදීමේදී ඉකුත් වර්ෂයේ මාස 06 ක ගෙවීම ප්‍රමාදවී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදනවලින් ඒ සඳහා රු.168,500 ක් වැය කර තිබුණි. සිසුන් වෙත ශිෂ්‍යාධාර ගෙවීමේ ප්‍රමාදය වළක්වා ගැනීමට අරමුදල මගින් නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ආ) පුනරුත්ථාපන වැඩසටහන යටතේ ආයතන 02 ක අන්ධ සිසුන් 75 දෙනෙකු වෙනුවෙන් පුහුණුවීම් ලබාදීමට සැළසුම් කර තිබුණ ද පුහුණුව ලබාදී තිබුණේ අන්ධ සිසුන් 16 දෙනෙකුට පමණි. ඉකුත් වර්ෂ 03 ඇතුළතම උපදේශකවරුන් 07 දෙනෙකු විසින් එම සිසුන් 16 දෙනා වෙත පුහුණුවීම් ලබා තිබූ නමුත් එම සංඛ්‍යාවේ වැඩිවීමක් සමාලෝචිත වර්ෂයේදී සිදුවී නොතිබුණි.

(ඇ) අක්ෂි ආබාධසහිත පුද්ගලයන් 75 දෙනෙකු වෙත අක්ෂිකාව ලබාදීම සඳහා රු.1,090,000 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර සංශෝධිත ක්‍රියාකාරී සැළැස්ම මගින් එම ප්‍රතිපාදනය රු.300,000 ක් දක්වාත් පුද්ගලයන් 20 දක්වාත් අඩුකරගෙන තිබුණි. කෙසේ වුවද, දෘශ්‍යාබාධිත පුද්ගලයන්ගේ අවශ්‍යතා හඳුනාගෙන එම කටයුතු වැඩි දියුණු කිරීම සිදුකළ යුතු වුවද පුද්ගලයන් 16 දෙනෙකුට පමණක් අක්ෂි කාව ලබාදීමට රු.171,550 ක් වියදම් දරා තිබුණි. ඒ අනුව ප්‍රතිපාදන මුදල් උපරිමව උපයෝජනය කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රීඩා දක්ෂතා වර්ධනය කිරීම සඳහා රු.400,000 ක් ලබාදීමට සැලසුම්කර තිබුණද, එක් ආයතනයක් වෙනුවෙන් රු.190,250 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේදී තවත් ආයතන 03 ක් සඳහා ක්‍රීඩා ආධාර ලබාදීමට මුදල් ප්‍රතිපාදනය කර තිබුණද විගණිත දිනය වූ 2018 ජූලි 31 දින දක්වාම ආධාර මුදල් කිසිවක් ලබාදී නොතිබුණි.

(ඉ) සීදූව වෘත්තීය පුහුණු ආයතනයේ දෘශ්‍යාබාධිත කාන්තා මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන යනු ලබන පේෂකර්ම මධ්‍යස්ථානයේ නිෂ්පාදනවලින් පසුගිය වර්ෂ 04 තුළ අලාභ ලැබ තිබූ අතර එම පේෂකර්ම මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම සඳහා කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඊ) 1992 අංක 09 දරන දෘශ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල් පනත අනුව අරමුදල විසින් ඉටුකළයුතු පරමාර්ථ අතරින් දෘශ්‍යාබාධිතයන්ට ශාස්ත්‍රීය පාඨමාලා හැදෑරීමට හෝ වෘත්තීය පුහුණුව ලබාගැනීමට හැකිවනු පිණිස ඔවුන්ට නිවාස පහසුකම් සැපයීමත් ඔවුන් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා අලෙවි පහසුකම් සැපයීමත් වෙනුවෙන් කිසිදු කාර්යයක් ඉටුකර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද කළමනාකරණ මණ්ඩල රැස්වීම්වලදී දෘශ්‍යාබාධිත අය සහ සියළුම ආබාධිත පුද්ගල සංඛ්‍යාව පිළිබඳව දත්ත ඒකකයක් පවත්වාගෙන යාම, දෘශ්‍යාබාධිතයන් සඳහා සමාජ ආරක්ෂණ ක්‍රමයක් සකස් කිරීම, දෘශ්‍යාබාධිත අඩු ආදායම්ලාභීන්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇතිකිරීම සහ අධ්‍යාපන පොදු සහතික සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ ඉගෙනුම ලබන දෘශ්‍යාබාධිත සිසුන්ට ශිෂ්‍යත්ව ලබාදීම සඳහා යෝජනා සම්මත කර ගෙන තිබුණු නමුත් ඊට අදාල කාර්යයන් කිසිවක් ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1992 අංක 09 දරන දෘශ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල් පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව අරමුදලේ කළමනාකරණය හා පරිපාලනය සාමාජිකයන් 13 දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් වෙත පැවරී තිබුණද මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු ඉකුත් වර්ෂ 02 ක දී සහ සමාලෝචිත වර්ෂයේදී පවත්වන ලද කිසිදු කළමනාකරණ මණ්ඩල රැස්වීමකට සහභාගීවී නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය පරිදි මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කර තිබුනේ 2018 අප්‍රේල් 03 දින දීය.

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම

ක්‍රියාකාරී සැලැස්ම ඉටුකර ගැනීමේ ප්‍රගතිය කාලානුරූපව පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සභාව විසින් හඳුන්වා දී නොතිබුණු අතර වර්ෂ කිහිපයක සිට එකම ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් වියදම්, තත්‍ය ආදායම් වියදම් සමඟ සැසඳීමේදී සියයට 8 සිට සියයට 52 දක්වා පරාසයක් තුල විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි අරමුදලේ විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) වැඩසටහන් පරිපාලනය | දෘශ්‍යාබාධිත පුද්ගලයින් වෙනුවෙන් පුනරුත්ථාපන වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක නොකිරීම. |
| (ආ) ආධාර ලබාදීම | අධ්‍යාපන කටයුතු සඳහා ආධාර ලබාදීමේ ප්‍රමාදයන් පැවතීම. |